# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/36 – 2022 අගෝස්තු මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2022.08.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු සුසාන භූමි හා මිනීපිටි පිළිබඳ ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයට අදාළව සුසාන භූමි හා මිනීපිටි පිළිබඳ ආඥා පනතේ 03 වන වගන්තිය යටතේ නිසි බලධරයා වන කඩුවෙල මහ නගර සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 02 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ආඥාපනතේ 5 වන වගන්තියෙන්, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවර වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම මළවුන් වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට මෙයින් නියම කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 ජූනි මස 27 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ලේ,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

1A – PG 5911– 11 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

**01. කලපලුවාව සුසාන භූමිය**

බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ මහත්මා විසින් 2021.03.18 දිනැති සංශෝධනයන් සහිතව පිළියෙල කර ඇති 2012.05.02 දිනැති අංක 12116 දරන පිඹුරේ විස්තර කර ඇති බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහා නගර සභා සීමාව තුළ පිහිටි කලපලුවාව ගමෙහි කලපලුවාව කනත්ත නැමැති ඉඩමේ ලොට් අංක A දරන අක්කර 01 රූඩ් 00 පර්චස් 34.00 (හෙක්ටයාර් 0.4921)ක් විශාල ඉඩම් කැබැල්ලට මායිම් -

| | |
|---|---|
| උතුරට | : ක්‍රීඩා පිටිය |
| නැගෙනහිරට | : පාසැල් මාවත |
| දකුණට | : එල්.ජී. සන්ධ්‍යා ස්වර්ණකාන්තිට අයත් ඉඩම |
| බස්නාහිරට | : සී.එන්. වික්‍රමසිංහ, එන්.කේ. රණසිංහ සහ ඒ.ඕ.ආර්. ප්‍රනාන්දු යන අයට අයත් ඉඩම් |

**02. බටපොත සුසාන භූමිය**

බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ මහත්මා විසින් 2021.03.18 දිනැති සංශෝධනයන් සහිතව පිළියෙල කර ඇති 2012.04.24 දිනැති අංක 12098 දරන පිඹුරේ විස්තර කර ඇති බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහා නගර සභා සීමාව තුළ පිහිටි බටපොත ගමෙහි බටපොත කනත්ත නැමැති ඉඩමේ ලොට් අංක X දරන අක්කර 01 රූඩ් 02 පර්චස් 13.00 (හෙක්ටයාර් 0.6399)ක් විශාල ඉඩම් කැබැල්ලට මායිම් -

| | |
|---|---|
| උතුරට | : රියන්සි විජේතිලකට අයත් ඉඩම සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ඉඩම |
| නැගෙනහිරට | : බටපොත කනත්ත පාර |
| දකුණට | : පාර හා ඩී.ඒ. චාලට් යන අයට අයත් ඉඩම |
| බස්නාහිරට | : ඩී.ඒ. චාලට් යන අයට අයත් ඉඩම, එන්.ඩී. දයාවතීට අයත් ඉඩම සහ රුහුණු පුර |

EOG 08-0039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.